# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016

**2022 මාර්තු/අප්‍රේල්**

**මානවශාස්ත්‍ර පීඨය**

**ප්‍රතිබිම්බ කලා - IMAT E 1025**

**ව්‍යවහාරික ඡායාරූපකරණය**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

1. (අ) චිත්‍රාගාර ඡායාරූපකරණය (Studio Photography) යනු කුමක්දැයි හඳුන්වා, චිත්‍රාගාරයක තිබිය යුතු උපකරණ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

   (ආ) එළිමහන් ඡායාරූපකරණයේදී (Outdoor Photogrphy) ඡායාරූප ශිල්පියෙකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි විස්තර කරන්න.

2. "සාම්ප්‍රදායික සිරිත් විරිත් වලට මුල්තැන ලබාදෙමින් කටයුතු කිරීම මංගල උත්සවයක ප්‍රධාන කාර්ය වේ."ඉහත කියමන කෙරෙහි අවධානය යොමු කරමින් වෘත්තීය මංගල ඡායාරූප ශිල්පියෙකුගේ වගකීම පිළිබඳ විස්තරයක් කරන්න.

3. වනජීවී ඡායාරූප ශිල්පියෙකු විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම ලයිස්තුවක් පිළියෙල කර, එයින් තෝරා ගත් ප්‍රධාන කරුණු හතරක් වෙන් වෙන්ව පැහැදිලි කරන්න.

4. මාර්ගගත අධ්‍යාපනයේ දී (Online Education) ඡායාරූපකරණය යොදාගත හැකි ආකාරය පිළිබඳ සඟරාවකට සුදුසු ලිපියක් සම්පාදනය කරන්න.

5. ආලේඛ්‍ය ඡායාරූපකරණය යනු කුමක්දැයි හඳුන්වා, ආලේඛ්‍ය ඡායාරූපකරණයේදී ඡායාරූප ශිල්පියෙකු විසින් අවධානය යොමු කළ යුතු කරුණු මොනවාදැයි නිදර්ශන සහිතව විස්තර කරන්න.

6. පහත ලබාදී ඇති ඡායාරූප ශිල්පීන් අතරින් දෙදෙනෙකු තෝරා, එම ඡායාරූප ශිල්පීන් වඩාත් ප්‍රචලිත වී ඇත්තේ ඡායාරූපකරණයේ කවර ව්‍යවහාරික අංශය කෙරෙහිදැයි සඳහන් කොට ඔවුන්ගේ දක්ෂතා හා හැකියාවන් පිළිබඳ සැකෙවින් විස්තර කරන්න.

   i. එඩ්වඩ් වෙස්ටන් ( Edward Weston)
   ii. රොබට් ඩෙමාකි ( Robert Demachy)
   iii. කෙවින් කාටර් (Kevin Kater)
   iv. හෙන්රි රාජකරුණා
   v. ඉන්ද්‍රනාත තේනුවර
   vi. මැන්දිස් වික්‍රමසිංහ

7. ඡායාරූප පුවත්පත් කලාව යනු කුමක්දැයි හඳුන්වා, ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පියෙකු විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම මොනවාදැයි පැහැදිලි කරන්න.

8. ඩිජිටල් තාක්ෂණයේ වර්ධනයත් සමග ඡායාරූප ශිල්පයට හා කලාවට සිදුවී ඇති යහපත් හා අයහපත් ප්‍රතිඵල පිළිබඳ විස්තරයක් කරන්න.

9. පහත සඳහන් ඡායාරූප ව්‍යවහාරයන් අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

i. නිසලජීවී ඡායාරූපකරණය (Still Life Photography)
ii. ළමා ඡායාරූපකරණය ( Child Photography)
iii. පුරාවිද්‍යා ඡායාරූපකරණය (Archaeological Photography)
iv. ක්‍රීඩා ඡායාරූපකරණය (Sports Photography)